දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2876169, 011-2876181
විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E - mail: info@psc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

**රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය**
**பகிரங்க சேவை ஆணைக்குழு அலுவலகம்**
**OFFICE OF THE PUBLIC SERVICE COMMISSION**

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
No. 1200/9, Rajamalwatta Road, Battaramulla.

මගේ අංකය / எனது இல. / My No.: PSC/APL/3/AT/SLTES 2024

ඔබේ අංකය / உமது இல. / Your No.: ED/04/59/08/01/01

දිනය / திகதி / Date: 2026.03. 20

**ලේකම්**
අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

**2025 වාර්ෂික ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අභියාචනාවලට අදාළ තීරණ දැනුම් දීම**

**ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය**

උක්ත කරුණ සම්බන්ධයෙන් වන ඔබේ සමාංක හා 2026.02.02 දිනැති ලිපිය හා බැඳේ.

02. ඉහත සඳහන් සේවාවේ නිලධරයන් සම්බන්ධයෙන් ඔබ විසින් අනුමත කරන ලද 2025 වාර්ෂික ස්ථාන මාරු නියෝගවලට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනාවලට අදාළව එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණ මේ සමඟ ඔබ වෙත එවමි.

03. එක් එක් නිලධාරියා සම්බන්ධයෙන් වන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ වෙනම දන්වා යැවීමට කටයුතු කරනු නොලැබේ. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ ස්ථාන මාරු අභියාචනයන්ට අදාළ නියෝග ප්‍රසිද්ධ කිරීමට අවශ්‍ය පියවර ගනු ලබන අතර මේ සම්බන්ධයෙන් 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ 2(ඇ) සහ (ඈ), 3 සහ 4 යන වගන්ති කෙරෙහි ඔබගේ අවධානය යොමු කරනු ලැබේ.

04. අදාළ නිලධාරීන් රාජ්‍ය සේවා කොමිෂන් සභා තීරණය සම්බන්ධයෙන් අතෘප්තියට පත්වන්නේ නම් 2002 අංක 04 දරන පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පනතේ විධිවිධානවලට අනුකූලව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත අභියාචනා ඉදිරිපත් කිරීමට හිමිකම් ඇත්තේ ය. එසේ වුවද, ඉදිරිපත් කරනු ලබන අභියාචනා සඳහා පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ අවසන් තීරණයක් ලැබෙන තෙක් ලබා දී ඇති ස්ථාන මාරු නියෝගය එලෙසම ක්‍රියාත්මක විය යුතු බව ද කාරුණිකව දැනුම් දෙමි.

05. එසේම ගුරු අධ්‍යාපනඥ සේවයේ නිලධාරීන්ගේ 2025 වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් වන ඉල්ලීම් හා ඒ සම්බන්ධයෙන් වන නිර්දේශ තවදුරටත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් නොකරන ලෙස ද වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

Mday

**ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න**
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

# වාර්ෂික ස්ථාන මාරු අභියාචනා තීරණ - 2025
## ගුරු අධ්‍යාපනඥ සේවය

| අනු අංකය | නිලධාරියාගේ නම | තනතුර හා ශ්‍රේණිය | වර්තමාන සේවා ස්ථානය | නව සේවා ස්ථානය | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය |
|---|---|---|---|---|---|
| 1 | එම්.ආර්. රසදා මිය | ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය | වව්නියාව ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය | උතුරු (වව්නියාව) පළාත් කාර්යාලය | 1. අභියාචනය නිශ්ප්‍රභ කිරීම.<br>2. නව බඳවාගැනීම්වලදී වව්නියා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය වෙත අනුප්‍රාප්තිකයෙකු ලබා දී පුත්තලම ගුරු වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානය වෙත ස්ථාන මාරු කරන ලෙස ලේකම්/අධ්‍යාපන අමාත්‍යාංශය වෙත දැනුම් දීම |
| 2 | ජී. සුරේෂ් මයා | ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය | වව්නියාව ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය | උතුරු (වව්නියාව) පළාත් කාර්යාලය | අභියාචනය නිශ්ප්‍රභ කිරීම |
| 3 | එස්. සිවරාතිකා මිය | ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය | වව්නියාව ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය | උතුරු (වව්නියාව) පළාත් කාර්යාලය | අභියාචනය නිශ්ප්‍රභ කිරීම |
| 4 | ඒ. මිහින්රාජ් මහතා | ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය | වව්නියාව ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය | | 1.අභියාචනය නිශ්ප්‍රභ කිරීම.<br>2. 2024 වාර්ෂික ස්ථානමාරු PSC/APL/14/67/2023 හා 2024.02.27 දිනැති නියෝගය අනුව ක්‍රියා කරන ලෙස ලේකම්/ අධ්‍යාපන අමාත්‍යාංශය වෙත දැනුම් දීම |

2026/03/17